චක්‍රලේඛ අංක: 1987/6.

මගේ අංකය: 2/පිරි/47
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.
1987.10.15 දින.

සියළුම ලියාපදිංචි පිරිවෙන්වල -
කෘත්‍යාධිකාරී හා පරිවෙනාධිපති ස්වාමීන් වහන්සේලා වෙත.

## පිරිවෙන් ගුරු පත්වීම් හා ස්ථාන මාරුවීම් අනුමත කිරීම.

1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි වගන්තිය කෙරෙහි ඔබ වහන්සේගේ අවධානය නැවතත් යොමු කරවමි. මේ අනුව පිරිවෙනක පරිවේනාචාර්යවරයකු (ගුරුවරයකු) විය යුත්තේ භික්ෂූන් වහන්සේ නමක්ම බවත්, සුදුසු භික්ෂූන් වහන්සේ නමක් සොයාගත නොහැකි අවස්ථාවක පමණක් සුදුසුකම් ලත් ගිහියකු පරිවේනාචාර්යවරයකු වශයෙන් පත්කර ගැනීමට අවස්ථාව ඇති බවත් දක්වා ඇත.

02. මෙම කරුණ පිළිබඳව මෙයට පෙරද උපදෙස් දී ඇතත්, එය එතරම් සතුටුදායක ලෙස පිළිපැද ඇති බවක් නොපෙනේ. මේ අනුව පිරිවෙන්වල ගිහි ගුරුවරුන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය ඉතා අසතුටුදායක වන අතර, පිරිවෙන් අධ්‍යාපන පනතේ අරමුණුවලට මෙය පටහැනිය.

03. එබැවින් මින්මතු ඔබවහන්සේගේ පිරිවෙනට බඳවාගනු ලබන ගුරුවරුන් පැවිදි පක්ෂයෙන්ම තෝරාගත යුතුබව දන්වමි. කිසියම් විෂයයක් හෝ විෂයයන් ඉගැන්වීමට පැවිදි ගුරුවරුන් තෝරාගත නොහැකි අවස්ථාවලදී පමණක් ගිහි ගුරුවරුන් පත්කර ගැනීමට අවකාශ ඇතත්, එබඳු ගුරුවරුන් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී පැවිදි ගුරුවරුන් සොයා ගැනීමට සාධාරණ උත්සාහයක යෙදුණු බව ඊට අදාළ ගැන්වෙන කරුණු යෝජනා පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

04. පිරිවෙන් ගුරුවරුන් උපැවිදිව දිගටම පිරිවෙන්වල සේවය කිරීම හෝ පිරිවෙනින් මාරුවී උපැවිදිවීම හෝ යන කරුණු දෙකම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු කරා යාමට බලවත් බාධකයක් බව පෙන්වා දෙන අතර, මෙම තත්ත්වය පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය විසින් අමාත්‍යාංශයේ අවධානයට යොමුකර ඇති බව ද දන්වනු කැමැත්තෙමි.

05. පිරිවෙන් රෙගුලාසි මාලාවේ 12(4) වගන්තිය යටතේ මාරුවීම් ඉල්ලුම් කරන පැවිදි ගුරුවරුන් පිළිබඳව ඉතා සුපරීක්ෂාකාරීව කටයුතු කිරීමට සිදුව ඇත. කෘත්‍යාධිකාරීන් වහන්සේලා පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු මුදුන්පත් කර ගැනීමෙහිලා දැඩි අවධානය යොමුකළ යුතු වන අතර, මේ පිළිබඳව දැන නගින සියලුම කරුණුවල වගකීම ද උන්වහන්සේලාට පැවරෙනවා ඇත. තමන්ගේ පිරිවෙනෙහි පටත්පිරිසෙයින් ආචාර්ය මණ්ඩලයේ අනුමත මුලු සංඛ්‍යාවෙන් අධිකව වැඩි ප්‍රමාණයක් පැවිදි ගුරුවරුන් තබා ගැනීමට කටයුතු කළයුතු අතර, මාරුවීම් අනුමත කිරීමේදී මින් ඉදිරියට මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන බවද සැළකුව මැනවි. වැටුප් ලබන ගුරුවරයකු වශයෙන් අනුමැතිය ලබා පිරිවෙනක ඉගැන්වීම් කරන පැවිදි ගුරුවරයකු එම තනතුරේ සිට උපැවිදි වුවහොත් ඔහුට තවදුරටත් එම පිරිවෙනෙහි හෝ වෙනත් පිරිවෙනක සේවය කිරීමට ඉඩදීම නුසුදුසු බව පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයෙන් උපදෙස් දී ඇත. ඒ අනුව මින් ඉදිරියට කිසියම් පැවිදි ගුරුවරයකු උපැවිදි වුවහොත් ඔහුගේ සේවය අවසන් කිරීමට සිදුවන බව ද දන්වමි. එබඳු අවස්ථා ඇතිවූ වහාම මෙම අමාත්‍යාංශයට හා ප්‍රදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දීම ඔබවහන්සේගේ වගකීමකි.

....../2

06. මගේ අංකය: 2/පිරි1/156 හා 1984.06.14 දිනැති ලිපියෙන් ද මෙයට පෙර උපදෙස් දී ඇති පරිදි මාරුවීම් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී පිරිවෙන් පරීක්ෂක හිමියන්ගේ නිර්දේශයද සහිතව යටත්පිරිසෙයින් සති දෙකකට කලින්වත් මා වෙත ඉදිරිපත් කළයුතු බව නැවත දැනුම් දෙන අතර, විධිමත් නියෝගයක් නොමැතිව මාරුවී පැමිණෙන කිසිම ගුරුවරයෙකුට පිරිවෙනේ වැඩ භාර නොදිය යුතු බව තරයේ අවධාරණය කරමි.

07. මෙම චක්‍රලේඛ ලිපියේ 05 වැනි ඡේදයේ සඳහන් උපදෙස් ඔබවහන්සේගේ ගුරු මණ්ඩලයට ද දැනගැනීමට සැලැස්විය යුතු බවද සැළකුව මැනවි.

ලේකම්.

අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්:- 1. සියළුම ප්‍රා.අ.අ./ප්‍ර.අ.නි.වරුන් වෙත-

- ඉහත 05 වැනි ඡේදයේ සඳහන් පරිදි අනුමත පැවිදි ගුරුවරයෙක් උපැවිදි වුවහොත් එදින සිට පත්වීම අවලංගු කිරමට කටයුතු කරන්න.

11. සියලුම පිරිවෙන් පරීක්ෂක හිමිවරුන් සහ මා.අ.නි.වරුන් වෙත:- ගුරු යෝජනාපත්

- සහ මාරුවීම් ඉල්ලුම්පත් නිර්දේශ කිරීමේදී මෙම ලිපියේ ඇති උපදෙස් පිළිබඳව ද... අවධානය යොමු කරන්න.

ශීමාආ/-